# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 සැප්තැම්බර්

**සමාජීය විද්‍යා පීඨය**

**ඉතිහාසය**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය: ක්‍රි.ව. 1594 සිට 1972 දක්වා HIST – E3015**

ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පළාත් පාලන ක්‍රමය හා බද්ද සංවිධාන පවත්වාගෙන ගිය ආකාරය කෙරෙහි අවධානය යොමු කරමින්, 1597න් පසු පහතරට ප්‍රදේශවල පැවති පෘතුගීසි පරිපාලන ක්‍රමය පිළිබඳ විමසන්න.

02. උඩරට රාජ්‍යයේ පාලකයන් විසින් පෘතුගීසීන් හා ලන්දේසීන් සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ප්‍රතිපත්තියේ ස්වරූපය විමසන්න.

03. 1638 ගිවිසුමේ වගන්ති සාකච්ඡා කොට ඒවා පසුකාලීනව උඩරට හා ලන්දේසි සම්බන්ධතා කෙරෙහි බලපෑ අයුරු විමසන්න.

04. 18 වන සියවසේ ඇතිවූ බෞද්ධ ප්‍රබෝධයෙහි ලා වැලිවිට සරණංකර හිමියන්ගේ කාර්යභාරය ප්‍රමාණ කරන්න.

05. 1815 දී කන්ද උඩරට රාජධානිය බ්‍රිතාන්‍ය බලයට නතුවීමෙහි ලා උඩරට රදළයන්ගේ ක්‍රියාකලාපය කොතෙක්දුරට හේතු වී දැයි සාකච්ඡා කරන්න.

06. 1833 දී කෝල්බෲක්-කැමරන් කොමිසම විසින් නිර්දේශ කරන ලද ආර්ථික හා පරිපාලන ප්‍රතිසංස්කරණ යෝජනා හඳුන්වා දෙන්න.

07. 19 වන සියවස තුළ දී ඇතිවූ හින්දු හා ඉස්ලාම් ආගමික පුනර්ජීවන ව්‍යාපාරය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

08. බ්‍රිතාන්‍යයන් විසින් 19 වන සියවස තුළ අධ්‍යාපනයේ ප්‍රගතිය උදෙසා ගන්නා ලද ක්‍රියාමාර්ග පරීක්ෂා කරන්න.

09. 1915 සිංහල-මුස්ලිම් කෝලාහලයට තුඩු දුන් හේතු සාකච්ඡා කරන්න.

10. පහත මාතෘකා අතුරින් **එකක් (01)** පිළිබඳව විග්‍රහ කරන්න.

    1) 1910 කෲ-මැකලම් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය

    2) 1972 ජනරජ ව්‍යවස්ථාව

*********************************